පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ව්‍යාපාර සංඛ්‍යානය

සතිය- අගෝස්තු - 2

ශ්‍රේණිය-12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

1. ප්‍රතිපායනය හා සහ සම්බන්ධතාවය ව්‍යාපාර ක්ෂේත්‍රයේදී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.
2. සිසුන් දහයක් විසින් සකස් කරන ලද අත්කම් නිර්මාණ සඳහා ඇගයුම්කරුවන් දෙදෙනෙක් විසින් ලබා දුන් ලකුණු පහත දැක්වේ.

ශිෂ්‍යයා	A	B	C	D	E	F	G	H	I	J
1 ඇගයුම්කරු	60	75	82	90	76	78	85	90	75	68
2 ඇගයුම්කරු	72	78	80	88	72	70	80	80	85	68

ඇගයුම්කරුවන් දෙදෙනාගේ ලකුණු පැවරීම් අතර සම්බන්ධයක් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා තරා සහ සම්බන්ධතා සංගුණකය ගණනය කර පැහැදිලි කරන්න.

3. පොහොර භාවිතය හා ඵලදායිතාව අතර සම්බන්ධතාවක් පවතී දැයි පරීක්ෂා කිරීම සඳහා කෘෂි භෝග වගා නිලධාරියෙකු සමීක්ෂණයක් සිදු කරන ලදී.අර්තාපල් බීජ පැල කිරීමෙන් ලැබුණු ඵලදාව පහත දැක්වේ.

පොහොර භාවිතය (kg)'000	2	4	5	7	10
අර්තාපල් අස්වැන්න (kg) '000	18	20	25	27	30

1.) දත්ත විසිරි තිත් සටහනකින් නිරූපණය කරන්න.
2.) X මත y හි ප්‍රතිපායන සමීකරණය ගොඩ නගා ප්‍රතිපායන සංගුණකය අර්ථකථනය කරන්න.
3.) පොහොර 600 kg භාවිතා කළ විට අපේක්ෂා කළ හැකි අස්වැන්න කොපමණද?
4.) නිර්මාණය කරන ලද ප්‍රතිපායන රේඛාවේ යෝග්‍යතාව පරීක්ෂා කර විවරණය කරන්න.